# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජිත හේරත් මහතා විසින්
2010 ජුනි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2010 මැයි මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[9 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (සන්නද්ධ හමුදා) පනතට 4අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එකී පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නෛතික බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති බලපාන්නාවූ සන්නද්ධ හමුදා සාමාජිකයකු යන යෙදුම නිර්වචනය කිරීම වන්නේ ය.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තියට ඉක්බිතිවම 4ආ, 4ඇ, 4ඈ, 4ඉ සහ 4ඊ යන අළුත් වගන්ති ඇතුළත් කිරීම මගින් එකී පනත සංශෝධනය කරනු ලබන අතර, අලුත් වගන්තිවල නීතය බලපෑම වන්නේ

(අ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

(i) සන්නද්ධ හමුදාවල නිත්‍ය උපසේවා, ස්වේච්ඡා බලකාය සහ ස්වේච්ඡා උපසේවාවේ සාමාජිකාවන් ට ද;

(ii) මේ සංශෝධනය ක්‍රියාත්මක වන දිනට පසු සන්නද්ධ හමුදාවල සාමාජිකාවන් වන්නා වූ තැනැත්තන්ට ද; සහ

(iii) ක්‍රියාන්තිත රාජකාරී ආදිය ඉටුකිරීමේ දී සිදු වූ තුවාල හේතු කොට ආබාධිත තත්වයට පත්වනු ලබන සන්නද්ධ හමුදාවල සාමාජිකාවන්ට ද,

බලපාන අයුරින් ව්‍යාප්ත කිරීම.

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඇ, 4ඈ, සහ 4ඉ වගන්තිවල කාර්ය සඳහා නිත්‍ය උපසේවා බලකාය, ස්වේච්ඡා බලකාය හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ සාමාජිකයන් යන යෙදුම නිර්වචනය කිරීම ද වේ.

## පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ)

## පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඒ පදනමට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද:

ඒ පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු වඩාත් සඵලාකාරයෙන් ඉටු කිරීමට ඒ පදනමට හැකිවනු පිණිස ඒ පදනම සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2010 අංක දරන පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය.

2—PL 004921 — 750 (2010/06)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ධර්ම දේශනා කිරීම, ධර්ම සාකච්ඡා කිරීම හා සම්මන්ත්‍රණ පැවැත්වීම;

(ආ) බෞද්ධ පොත්පත්, සඟරා කලාප, පත්‍රිකා, වැඩසටහන් මුද්‍රණය කිරීම, පලකිරීම, බෙදා හැරීම;

(ඇ) කියවීම් ශාලා, දේශන ශාලා, අධ්‍යාපන ශාලා පිහිටුවීම, පවත්වාගෙන යාම සහ බෞද්ධ ධර්මය අධ්‍යයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරනය කිරීම;

(ඈ) බෞද්ධ සංස්කෘතිය වර්ධනය කිරීම උදෙසාද, සදාචාර වර්ධනය උදෙසාද අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම;

(ඉ) බෞද්ධයාගේ දිවිමග දියුණු කිරීමට, ජාතික, ආගමික සිරිත් විරිත් ප්‍රගුණ කිරීමට ආධ්‍යාත්මික ගුණවගාවන් වැඩි දියුණු කිරීමට පියවර ගැනීම;

(ඊ) ජාතික, ආගමික සහ වාර්ගික භේදවලින් තොරව සාමාජික හා ආර්ථික දුෂ්කරතාවලින් තරුණ පරපුර බේරා ගැනීමට පියවර ගැනීම;

(උ) බෞද්ධ ප්‍රතිපත්ති අනුව සමාජ සේවා කටයුතු කිරීම සහ ඒ සඳහා බෞද්ධයන් උනන්දු කරවීම;

(ඌ) අධ්‍යාපනික, සමාජ සේවාමය කටයුතු සඳහාද, අධ්‍යාපන ආයතන, ළමා නිවාස, වැඩිහිටි නිවාස, නේවාසිකාගාර, සමාජ සේවා ආයතන පවත්වාගෙන යාම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජන කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, දේවල් ඉටු කිරීමේ හා කාරණා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, අධ්‍යක්ෂ ජනරාල්, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ සාමාජිකයා වූ පහලගම ශ්‍රී සෝමරතන නාහිමි අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු ය. සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින්, කලින් කල, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන්

කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) නිලතල දරන්නන් තෝරා පත් කිරීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්යය;

(ඇ) කළමනාකාර කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම, ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්යය;

(ඈ) සංස්ථාවේ, කළමනාකාර කමිටුවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම් පැවැත්විය යුතු වේලාව, ස්ථානය, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ එහි දී කටයුතු කර ගෙන යාම;

(ඉ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම, කාර්යය සහ කර්තව්‍ය;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් තැබීම හා විගණනය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සභාව විසින් සහ සභාවට ගෙවිය යුතු ණය.**

**7.** මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සභාවෙහි පවත්නා සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සභාවට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, බද්දක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**9.** කළමනාකාර කමිටුවේ සාමාජිකයකු සහ ගරු ලේකම්වරයා හෝ කළමනාකාර කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපැමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.